# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,729 — 1959 අප්‍රේල් 24 වැනි සිකුරාද—24.4.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඞ කරන ලදි)

# I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... | 991 | තොවුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 994 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 996 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු-ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී, ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායඞ් සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක්ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාතීමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් පසු එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත්, එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම, එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—" නව ප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද, එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදි ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

5. **අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනකුට මද, ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුවදයක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාතීමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුද හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්ද ' යි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපෙක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපෙක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපෙක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයැදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### රජයේ (සිංහල) අභ්‍යාස විද්‍යාලයයන්හි අභ්‍යාස ආචාරිණී තනතුර

රජයේ අභ්‍යාස විද්‍යාලයයන්හි අභ්‍යාස ආචාරිණී තනතුර සඳහා 1959 මැයි මස 15 වන දින තෙක්, කොම්පඤ්ඤවීදියේ මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපනාධ්‍යක්ෂ වරයා (ටී. සී. ශාඛාව) විසින් ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය :** මේ තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රුපියල් 3,060—120,—180 හා 240—5,820 ක් වේ.

3. **අවශ්‍ය අධ්‍යාපන හා අනිත් සුදුසුකම් :**

(i) අයදුම් කරුවන් උපාධිය ලැබීමෙන් පසු තුන් අවුරුදු ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති උපාධිධාරීන් හෝ පුහුණුවීමෙන් පසු යටත් පිරිසෙයින් පස් අවුරුදු ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති ද්විතීයික පුහුණු ගුරුවරියන් හෝ විය යුතු ය. අධ්‍යාපනය, අධ්‍යාපන මනෝවිද්‍යාව, ගණිතය හා සමාජ අධ්‍යයනය යන විෂයයන්ගෙන් දෙකක් ඉගැන්වීමට අයදුම් කරුවන්ට හැකියාවක් තිබිය යුතු ය.

(ii) 1959.5.15 වන දිනට අයදුම් කරුවන් වයසින් අවුරුදු 25 ට අඩු හෝ 50 ට වැඩි නොවිය යුතු ය. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් සම්බන්ධයෙන් වැඩි වයස් සීමාව නොයෙදේ.

(iii) තෝරාගනු ලබන අයදුම්කරු දැනට රජය යටතේ ස්ථිර තනතුරක් දරන්නේ නැත්නම් තුන් අවුරුදු සේවා පරීක්ෂණයකට යටත්ව පත්කරනු ලැබේ.

4. **විශේෂ කොන්දේසි :**

(i) තෝරාගනු ලබන අයදුම්කරු පළමුවරට උයන්වත්ත අභ්‍යාස විද්‍යාලයට පත්කරනු ලැබේ. එහෙත් ස්ථාන මාරුකර යැවීමට යටත් ය.

(ii) ඉල්ලුම් පත්‍ර නියමිත පෝරමයෙහි පුරවා එවිය යුතු ය. ආදර්ශ පෝරමයක් මෙහි පහත දී තිබේ. මේ කාර්යාලයෙන් පෝරම නිකුත් කරනු නොලැබේ. ඉල්ලුම් පත්‍ර පිළියෙළ කළ යුත්තේ මේ ආදර්ශ පෝරමය අනුවය.

(iii) පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ මෙම තනතුර විශ්‍රාම වැටුප්වලට හිමිය. මෙම තනතුර සඳහා තෝරාගැනීමට පෙර, විශ්‍රාම වැටුප් පනත යටතේ ගුරුවරියක වශයෙන් විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන ගුරවරියක පත්කරනු ලැබුවහොත් ඇය මේ තනතුර දරනතාක් මේ තනතුර විශ්‍රාම වැටුප්වලට හිමි ය යි ප්‍රකාශ කරනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡෙදයේ මුල පළකර තිබෙන රජයේ සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසිද බලනු මැනවි.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපනාධ්‍යක්ෂ වෙනුවට.

අංකය : ටී. සී. සී. 2761.
1959 අප්‍රේල් මස 20 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන
දෙපාර්තමේන්තුවේ දී ය.

### ආදර්ශ පෝරමය

**උයන්වත්ත—රජයේ අභ්‍යාස විද්‍යාලයයේ අභ්‍යාස ආචාරිණී තනතුර පිළිබඳ ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. 1959. 5. 1. වැනි දි නට සම්පූර්ණ වයස—අවුරුදු :————, මාස :————, දින :————.
4. ජාතිය හා එය ලබා ගත් අන්දම :————.
5. උපන් ස්ථානය :—
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඇගේ පියා :————.
   (ඉ) ඇගේ පියාගේ පියා :————.
   (ඊ) ඇගේ පියාගේ පියාගේත් පියා :————.
6. ශාස්ත්‍රීය සුදුසුකම් හා ඒවා ලබාගත් දින :————.
   (ලබා තිබෙන උසස්ම අධ්‍යාපන සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතු ය.)
7. වෘත්තීය සුදුසුකම් :————.
8 ඉගෙනීම ලැබූ පාඨශාලා හා විද්‍යාල :————.
   (ඇතුළත්වූ හා අස්වූ දින සඳහන් කළ යුතුය)
9. ඉගැන්වීමේ පළපුරුද්ද (මෙහි පහත දැක්වෙන පෝරමයෙහි විස්තර සඳහන් කරන්න) :————.

| පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම | ඇතුලත් වූ දිනය | අස්වූ දිනය | දරූ තනතුර | සේවාකාල කාලය අවු.මා.දි. | අස්වීමට හේතුව |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | මුළු කාලය | |

10. සිංහල භාෂාවෙන් ලබා තිබෙන සුදුසුකම් :————.

11. චරිත සහතික ලබාගත් අයගේ (ඥාතීන් නොවෙයි) නම් හා පදවි) සහතික තුනක පිටපත් (මුල් පිටපත් නොවෙයි) ඇමිනිය යුතුය. රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍ය ය :————.

12. වෙනත් සුදුසුකම් :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම් කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් ලියා තිබෙන බව තේරීමට කලින් අනාවරණය වුවහොත් මා එයින්ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව, තේරීමෙන් පසු ඒ බව දැනගන්නට ලැබුනොත්, කිසිම වන්දියක් රහිතව, මා රාජකාරියෙන් පහකර දැමීමට යටත් වන බවද මම දනිමි.

දිනය :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

---

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### සිංහල භාෂා පරිවර්තක තනතුරු

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සිංහල භාෂා පරිවර්තක තනතුරු තුනක් සඳහා අයදුම් පත් එවන ලෙස සුදුස්සන්ට මෙයින් ආරාධනය කරමි. මෙහි පහත දක්වෙන ඉල්ලුම් පත්‍රයේ අන්දමට පිළියෙළ කරන ලද අයදුම්පත් වර්ෂ 1959 මැයි මස 8 වැනි දිනට පෙර මට ලැබෙන්නට එවිය යුතු ය.

2. **වැටුප.**—මේ තනතුරුවලට නියමිත වැටුප් ක්‍රමය, රුපියල් 3,900—රුපියල් 180 හා රුපියල් 240—රුපියල් 6,540.

3. **සේවයේ කොන්දේසි.**—

(i) මේ තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිත ය ; මේ තනතුරට තෝරා ගනු ලබන අපේක්ෂකයා තුන් අවුරුද්දකට නො වැඩි ආධුනික කාලයක් සහිත ව පත් කරනු ලැබේ.

(ii) සුළු කාලයක් ඇතුළත දී තනතුරුවල වැඩ බාර ගන්නා ලෙස තෝරාගත් අපේක්ෂකයන්ට නියම කරනු ලැබේ.

(iii) තනතුරට අයත් කාර්ය නම්, ලිපි ලේඛනාදිය ඉංග්‍රීසියෙන් සිංහලට පරිවර්තනය කිරීම, සිංහලයෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම, අනෙක් දෙපාර්තමේන්තු වලින් එවන සිංහල පරිවර්තනයන් ප්‍රතිශෝධනය කිරීම සහ දෙපාර්තමේන්තුවෙන් නියම කෙරෙන වෙනත් කටයුතු කිරීම ද වේ. භාෂා පිළිබඳ විශේෂ ප්‍රවීණත්වයක් ඔවුන්ගෙන් බලාපොරොත්තු වනු ලැබේ.

(iv) උසස් සුදුසුකම් හා පළපුරුද්ද අනුව යම් යම් අපේක්ෂකයන් මේ තනතුරුවලට විශිෂ්ට ලෙස යොග්‍ය වුවහොත්, ඔවුන්ට, වැටුප් ක්‍රමයේ මූලික පියවරෙහි සිට නො ව අන් කිසි සුදුසු පියවරක සිට වැටුප් ගෙවීමට සැලැස්විය හැකි ය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—හැම අයදුම්කරුවකු ම—

(අ) සිංහලය විෂයයක් වශයෙන් ඇති උපාධියක්, පිළිගත් විශ්ව විද්‍යාලයකින්, ලැබූ අයකු බවට ; නැතහොත්

(ආ) සිංහල භාෂා පරිවර්තකයකු වශයෙන් දහ අවුරුද්දක පළපුරුදුකම් ඇත්තාවූ, හෝ තමා යටත් පිරිසෙයින් උපාධිධරයන්ට සමාන ප්‍රවීණතාවක් ඇති උගතකු බව තේරීම් සභාවට ඒත්තු යන සේ කරුණු ඉදිරිපත් කළ හැකි ලේඛකයකු නොහොත් ග්‍රන්ථ කර්තෘවරයකු වූ හෝ බවටත්, ඉංග්‍රීසිය පිළිබඳ ඉතා හොඳ දැනුමක් ඇත්තා වූ අයකු බවටත් ;

(ඇ) දැන් ආණ්ඩුවේ සේවයෙහි යෙදී නො සිටිතොත් 1959 මැයි මස 8 වැනිදාට තමාගේ වයස අවුරුදු 25ට නො අඩු බවටත් 50ට නො වැඩි බවටත් ;

(ඈ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවටත් සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය.

5. හැම අයදුම්කරුවකු ම විසින් පහත පෙනෙන සහතිකවල පිටපත් (මුල් ලිපි නොවේ) තම අයදුම්පතට අමුණා එවිය යුතු ය :—

(අ) උප්පැන්න සහතිකය (**සැලකිය යුතුයි.**—බවුතිස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර බාර ගනු නො ලැබේ) ;

(ආ) උසස් ම අධ්‍යාපනික සුදුසුකම් සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ ලැබූ සහතික පත්‍රය ;

(ඇ) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, මේ තනතුරට ඇති යෝග්‍යතාව යන මේවා සම්බන්ධයෙන් මෑත දී ලබාගත්තා ලද සහතික තුනක් (රාජ්‍ය සේවාවෙහි සිටින අයදුම්කරුවන්ගෙන් මේ බලාපොරොත්තු නො වේ).

**සැලකිය යුතුයි.**—සහතික පත්‍රවල හා චරිත සහතික පත්‍රවල පිටපත් ආපසු එවනු නො ලැබේ.

6. ආණ්ඩුවේ සේවයෙහි නියුක්ත නිලධාරීන් එවන අයදුම්පත් නියමිත දිනයෙන් පසු ව මෙහි ලැබුණොත්, ඒ අයදුම්පත් බාරගනු ලබන්නේ ඒවා නියමිත දිනයට කලින් දෙපාර්තමේන්තු ප්‍රධානියාට ලැබී තිබුන හොත් ද, ඒවා ප්‍රමාද වීමට සෑහෙන හේතු දක්වමින් එම අයදුම් පත් භාර ගන්නා ලෙස දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා නිර්දේශ කළ හොත් පමණකි.

7. අයදුම්පත් හා ඒ පිළිබඳ සෙසු ලියුම් කියුම් එවිය යුත්තේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියකුගේ පෞද්ගලික නමට නො ව, රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ විශේෂ කොමසාරිස් හට ය.

8. ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයෙහි පළ වූ ද, රාජ්‍ය සේවාවේ තනතුරුවලට කෙරෙන පත් කිරීම් පිළිබඳ වූ ද පොදු කොන්දේසි බලනු මැනවි.

9. එවන හැම අයදුම් පතක් ම මෙහි ලැබුණ බව දන්වා එවනු ලැබේ. අයදුම්පත් බාර ගන්නා අවසාන දිනයේ සිට, තුන් දවසක් ඇතුළත එවැනි දැන්වීමක් යම් අයදුම්කරුවකුට නො ලැබුණොත් ඔහු විසින් ඒ බව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ විශේෂ කොමසාරිස් හට වහා ම දන්වා එවිය යුතු ය. එසේ නො කරන අයගේ හිමිකම් ගැන සලකනු නො ලැබේ.

රාජ්‍යභාෂා කටයුතු පිළිබඳ විශේෂ කොමසාරිස්.

1959 අප්‍රේල් මස 24 වැනිදා,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 598,
22, රීඩ් මාවත, කොළඹ 7.

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### සිංහල පරිවර්තක තනතුරු සම්බන්ධ ඉල්ලුම් පත්‍රය

(1) අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
(අ) අගට යෙදෙන නම :————.
(ආ) අනිත් නම් :————.

(2) ලිපිනය :————.

(3) (අ) වර්ෂ 1959 මැයි 8 වැනි දිනට සම්පූර්ණ වයස—
අවුරුදු :————මාස :————දවස් :————.
(ආ) උපන් දිනය හා ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතු යි) :————.

(4) රටවැසි භාවය සහ එය කෙසේ හිමි වී ද යන බව :————.

(5) (අ) පියාගේ සම්පූර්ණ නම :————.
(ආ) පියා උපන් දිනය සහ ස්ථානය :————.
(ඉ) ඔහුගේ රටවැසි භාවය :————.

(6) අයදුම්කරු විවාහක ද, අවිවාහක ද, කනවැන්දුම් ද යන බව (විවාහක නම් විවාහ වූ දිනයත් දරුවන් ගණනත් සඳහන් කළ යුතු යි) :————.

(7) මූලික අධ්‍යාපනය ලත් පාඨශාලා සහ විද්‍යාල (ඒවාට ඇතුළත් වූ සහ අස් වූ දින සඳහන් කළ යුතු යි :————.

(8) (අ) ශාස්ත්‍රාලයීය සහ වෘත්තීය සුදුසුකම් (ඒවා ලත් දිනත්, සාමාර්ථය ලැබූ පෙළත් සඳහන් කළ යුතු යි. සහතික පිටපත් ද අමුණා එවිය යුතු යි) :————.
(ආ) සිංහල සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් සාමාර්ථය ලත් උසස්ම විභාගය—
සිංහල :————.
ඉංග්‍රීසි :————.

(9) (අ) පරිවර්තක වැඩ සම්බන්ධයෙන් පළපුරුදුකම් තිබේ නම් දින සමඟ විස්තර සඳහන් කරන්න :————.
(ආ) සාහිත්‍ය කෘතීන් කර පළපුරුදුකම් තිබේ නම් දින සමඟ ඒවා ද සඳහන් කරන්න :————.

(10) (අ) පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් හෝ අස් වූ පසු නියුක්තව සිටි රක්ෂාවල් ද, ඒ පිළිබඳව වකවානු ද, ලැබූ වැටුප් ද සඳහන් කරන්න :————.
(ආ) රජයේ සේවයේ යෙදී සිටී නම්, තත්ත්වයත්, වාර්ෂික වැටුපත් සඳහන් කරන්න :————.

(11) විශේෂ පළපුරුදු, පුහුණුවීම්, සුදුසුකම් සහ හිමිකම් :————.

(12) පෞද්ගලික ලෙස ආශ්‍රය කරන තිදෙනකුගේ නම් (තත්ත්වය සහ ලිපිනය සඳහන් කරන්න. මේ අය ඔබේ ඥාතීන් නොවිය යුතුයි)—

(i) ————.
(ii) ————.
(iii) ————.

(13) චරිත සහතික දී ඇති අයගේ නම් සහ තත්ත්ව (ඥාතීන් නො විය යුතු යි. මෑතක දී ලත් චරිත සහතිකවල පිටපත් පමණක් අමුණා එවිය යුතු යි) :————.

(14) මුදල් කරදර නැති වූවෙක් ද යන වග—නැති නම් ණය ප්‍රමාණය (ගණන් විස්තර කරන්න) :————.

(15) වෙනත් කරුණු :————.

මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය බව හෝ පත්වීම දෙන්නට පෙර හෙළිවුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගුකිරීමට ද, පත්වීම ලැබුවාට පසු හෙළිවුවහොත් කිසි ම වන්දි ගෙවීමක් නැති ව, මා නිලයෙන් අස්කිරීමට ද යටත් වන බව මම දැන සිටින බව ද, මේ අයදුම් පතෙහි දක්වෙන සියලු විස්තර සත්‍ය බව ද නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

————.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සිංහල/දෙමළ භාෂා පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණය

## 1959, ජූලි මස

**1. විභාග දිනය :** 1959 ජූලි මස 4 වැනි දින.

දෙපාර්තමේන්තු මධ්‍යස්ථානවල දී පුහුණු කරන ලද්දා වූ නිලධාරීන්ගේ ද, මේ විභාගයට පෙනී සිටීමට කැමැති අනෙක් නිලධාරීන්ගේ ද සිංහල/දෙමළ භාෂා පිළිබඳ ප්‍රවීණතාවය පරීක්‍ෂා කිරීම සඳහා සාමාන්‍ය සහ උසස් යන පෙළවල් දෙකකින් පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

සංලක්‍ෂය : රාජ්‍ය භාෂාව වන සිංහල භාෂාවේ ප්‍රවීණතාවය ලැබීම ගැන රජයෙන් පිරිනමන ප්‍රසාද මුදලට සුදුසු කම ලබනු සඳහා ආදි ප්‍රවේශක නිලධාරීන් විසින් සමත්විය යුතු පරීක්ෂණය නම් 1957, මැයි මස 23 වැනි දතමින් පිට කරන ලද අංක 379 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛයෙහි විස්තර කර ඇති, එමෙන් ම 1958, සැප්තැම්බර් මස 4 වැනි දතමින් පිට කරන ලද අංක 2/9/156/1 (එච්) දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛ ලිපියෙහි සංශොධිත වූ සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා (උසස් පෙළ) පරීක්ෂණයයි.

**2. පරීක්ෂණ මධ්‍යස්ථාන :**

පරීක්ෂණය කොළඹ හා පහත දක්වන මධ්‍යස්ථානවල පවත්වනු ලැබේ :—කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, මහනුවර, මාතලේ, නුවර එළිය, රත්නපුරය, කෑගල්ල, කුරුණෑගල, පුත්තලම, හලාවත, යාපනය, මන්නාරම, වවුනියාව, අනුරාධපුර, පොළොන්නරුව, බදුල්ල, මඩකලපුව සහ ත්‍රිකුණාමලය.

විභාගාපේක්ෂකයන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නැති ඕනෑ ම මධ්‍යස්ථානයක් අවලංගු කර දැමීමට පුළුවන.

විභාගාපෙක්ෂකයන් තම තමන්ට දී තිබෙන විභාග ශාලාවට පැමිණිය යුතු ය. එය හැර අන් කිසි ම ශාලාවකට ඔවුහු ඇතුල් කර ගනු නො ලැබෙති.

**3. අවශ්‍ය සුදුසුකම් :**

(i) රජයේ සේවයේ නියුක්ත (තාවකාලික නිලධාරීන් ඇතුලුව) පහත දක්වන වර්ගවලට අයත් නිලධාරීහු මේ පරීක්ෂණයට සුදුස්සෝ වෙති :—

(අ) වර්‍ෂයකට රු. 600කට නො අඩු ස්ථාවර වැටුපක් ලබන අය.

(ආ) වර්‍ෂයකට රු. 600කට නො අඩු මූලික පියවරක් ඇති වැටුප් ක්‍රමවල සිටින අය.

(ඇ) දෛනික වැටුපෙහි මූලික පඩි ක්‍රමය 300න් වැඩි කළ විට රු. 600කට නො අඩුවන දෛනික වැටුප් ලබන අය.

(ii) වර්‍ෂයකට රු. 600කට නො අඩු ස්ථාවර වැටුපක් ලබන්නා වූ නැතහොත් වර්‍ෂයකට රු. 600කට නො අඩු මූලික පියවරක් ඇති වැටුප් ක්‍රමයක් ලබන්නා වූ පළාත් ආණ්ඩු සේවාවේ ස්ථිර නිලධාරීහු ද මේ පරීක්ෂණයට සුදුස්සෝ වෙති.

(iii) තම නිලධාරීන්ගේ සුදුසුකම්වල හරිවැරදි බැලීම ගැන දෙපාර්තමේන්තු ප්‍රධානීහු වග කිවයුතු වෙති.

**4. අයදුම් පත් :**

(i) විභාගාපෙක්ෂකයන් තම ප්‍රාදේශික කාර්යාලයේ හෝ උප කාර්යාලයේ හෝ පාඨශාලාවේ ප්‍රධාන තැන මගින් නියමිත ඇතුල්වීමේ ලැයිස්තුවල අයදුම් පත් ඉදිරිපත් කළ යුතු ය. මේ ඇතුල්වීමේ ලැයිස්තු සෑම ප්‍රාදේශික ප්‍රධාන නිලධාරියකුට ම, විභාග කොමසාරිස් තුමාගෙන් කෙළින් ම ඉල්ලුම් කිරීමෙන් ලබා ගත හැකි ය. තම ප්‍රාදේශික කාර්යාලවලට හෝ උප කාර්යාලවලට හෝ පාඨශාලාවලට බෙදා හැරීම පිණිස දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් ලැයිස්තු ලබා ගැනීම අනවශ්‍ය ප්‍රමාදයට හේතු වන්නක් වෙයි.

(ii) ලැයිස්තුවල යොදන නාම හා නිලතල ටයිප් කරවිය යුතු ය. පිටපත් තුනෙහි ම එක් එක් අනුක්‍රමික අංකය ඉදිරියේ ඇති නාමය වෙනස් නොවීම ඒකාන්ත කර ගනු පිණිස දෙවැනි පිටපත හා තුන් වැනි පිටපත කාබන් පිටපත් විය යුතු ය. කාර්යාලයේ ටයිප් රයිටරයක් නැතිකම නිසා, ඉහත කී අයුරින් කටයුතු කිරීම අපහසු අවස්ථාවල දී නාම හා නිලතල අතින් ලිවීම කළ හැකි ය. එහෙත් මුද්‍රණයේ දී භාවිතා කරන අන්දමේ අකුරු පාවිච්චි කළ යුතු ය. අපෙක්ෂකයන්ගේ නාම හා ඔවුන්ගේ නිලතල ඉංග්‍රීසියෙන් දිය යුතු ය. ගුරුවරුන් සම්බන්ධයෙන් ඔවුන්ගේ නිලතල, සුදුසුකම හා රක්‍ෂාවේ තරාතිරම දක්වන්නක් විය යුතු ය. උදා :—උපාධිලත් ගුරුවරයා, ii වැනි ශ්‍රේණිය, විශෙෂ ධූර ලත් ගුරුවරයා, ආදි වශයෙනි. ලියා පදිංචි වු ගුරුවරයෙකු සම්බන්ධයෙන් නම් නිලයත් සමග ලියා පදිංචි කළ අංකයද දැක්විය යුතු යි.

(iii) එක් එක් ප්‍රාදේශික ප්‍රධානයකු විසින් ලැයිස්තු අත්සන් කළ යුතු ය. ඊට පසු කල් ඇති ව රෙජිස්ටර් කවරයක බහා දෙපාර්තමේන්තු ප්‍රධානයා වෙත පිටපත් තුනම ඉදිරිපත් කළ යුතු ය. මෙහි දී, "ප්‍රාදේශික ප්‍රධානයා" යන්නෙන් අයදුම් කරුවා හෝ අයදුම් කරුවන් වැඩ කරන උප කාර්යාලය හෝ උප දෙපාර්තමේන්තුව හෝ පාඨශාලාව කෙළින් ම භාරව සිටින නිලධාරියා අදහස් කෙරෙයි. දෙපාර්තමේන්තුවල ප්‍රධාන කාර්යාලවල වැඩ කරන අපෙක්‍ෂකයන් සම්බන්ධයෙන්, දෙපාර්තමේන්තු ප්‍රධාන තැන, මේ නිවේදනයේ සියලු ම කාර්යයන් උදෙසා, ප්‍රාදේශික ප්‍රධාන තැනගේ තත්ත්වය ගන්නුවා ඇත. ප්‍රාදේශික ප්‍රධාන තැනගේ නිලය වහා හඳුනාගත හැකි පරිදි සටහන් කළ යුතු ය. දෙපාර්තමේන්තු තුළ පාවිච්චි කරන නිලතල පිළිබඳ කෙටි සටහන් ක්‍රම නොයෙදිය යුතු ය. රජයේ පාඨශාලාවලින් එවන ඇතුල්වීමේ ලැයිස්තු අධ්‍යාපන අධ්‍යක්ෂගේ නමින් නියමිත ශාඛාවට විනා අධ්‍යාපන නිලධාරි හෝ සංචාරක පරීක්‍ෂක මාර්ගයෙන් නොඑවිය යුතු ය.

(iv) කාර්යාලයකින් හෝ ප්‍රාදේශික කාර්යාලයකින් හෝ උප කාර්යාලයකින් හෝ පාඨශාලාවකින් හෝ විභාගය සඳහා ඉදිරිපත් වන සියලුම අපේක්‍ෂකයන් එකට එකම මධ්‍යස්ථානක දී පෙනී සිටිය යුතු ය. කිසි ම කෙනකුට වෙනත් මධ්‍යස්ථානයක දී පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

එක් දෙපාර්තමේන්තුවකින්/ප්‍රාදේශික කාර්යාලයකින්/පාඨශාලාවකින් වෙනත් දෙපාර්තමේන්තුවකට/ප්‍රදේශික කාර්යාලයකට/පාඨශාලාවකට කිසියම් අපෙක්ෂකයකු මාරු කරන ලද අවස්ථාවක දී එම අපෙක්ෂකයා තම දෙපාර්තමේන්තුවේ/ප්‍රාදේශික කාර්යාලයේ/පාඨශාලාවේ ප්‍රධානයා මගින් තම නම කලින් සිටි දෙපාර්තමේන්තුවේ/ප්‍රාදේශික කාර්යාලයේ/පාඨශාලාවේ ලැයිස්තුවෙන් තමන් දැනට සිටින දෙපාර්තමේන්තුවේ/ප්‍රාදේශික කාර්යාලයේ/පාඨශාලාවේ ලැයිස්තුවට මාරු කරන ලෙස වහා ම ඉල්ලා සිටිය යුතු ය. ඔහු විභාග කොමසාරිස් තුමාගෙන් තම අළුත් සූචි අංකය හා වෙනස් කළ විභාග ස්ථානය සහිත අළුත් ප්‍රවේශ පත්‍රයක් (පත්‍රයක් එතකලියෙනුත් ලැබී ඇත්නම්) ලබා ගත යුතු ය. කලින් තමාට ලැබුණු ප්‍රවේශ පත්‍රය අවලංගු වූ ද තමන් විසින් පාවිච්චි නොකරන ලද්දා වූ ද එකක් ලෙස සැළකිය යුතු ය. කලින් සිටි දෙපාර්තමේන්තුවට ම/ප්‍රාදේශික කාර්යාලයට ම/පාඨශාලාවට ම/දැනුදු තමන් අයිති අන්දමින් විභාගයට පෙනී සිටීමට අපෙක්ෂකයාට වුවමනා නම් ඊට තහනමක් නැත. එහෙත් එසේ කොට ප්‍රතිඵල නිකුත් වූ කල්හි ප්‍රතිඵල ලබා ගත යුත්තේ, එසේ තමන් කලින් සිටි දෙපාර්තමේන්තු ප්‍රධානයා ගෙනි.

(v) **ඇතුල්වීමේ ලැයිස්තු පිරවිය යුත්තේ එහි සඳහන් උපදේශයන් අනුව ය. මේ උපදේශයන් පරිස්සමින් පිළිපැදිය යුතු ය.** රජයේ සේවයේ නියුක්ත වූ ද, පළාත් ආණ්ඩු සේවයේ නියුක්ත වූ ද නිලධාරීන්ගේ නාමයන් සේවය හෝ ශ්‍රේණිය හෝ පඩකතිය අනුව වර්ග කිරීමට කටයුතු යොදන සේ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගෙන් සහ ප්‍රාදේශික ප්‍රධානයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. ගුරුවරුන් සම්බන්ධයෙන්, නාමයන් ඔවුන්ගේ **සුදුසුකම් හා රක්‍ෂාවේ තරාතිරම** දක්වන අයුරින් වර්ග කළ යුතු ය. උදා :—විශෙෂ ධූර ලත් ගුරුවරුන් එකට, උපාධි ලත් ගුරුවරුන් ඊළඟට, ඉක්බිති ව සහතික පත් නො ලත් ගුරුවරුන් ආදී වශයෙනි.

(vi) **මේ රෙගුලාසිවලට අනුකූල නොවන්නා වූ හෝ එහි සඳහන් උපදේශවලට අනුකූලව සූදානම් නොකරන ලද්දා වූ ඇතුල්වීමේ ලැයිස්තු ප්‍රතික්ෂෙප කරනු ලැබේ. එවැනි ප්‍රතික්ෂෙප කිරීමකින් මතුවන ප්‍රශ්නයන්ට දෙපාර්තමේන්තු ප්‍රධානයා හෝ ප්‍රාදේශික ප්‍රධාන තැන වගකිවයුතු වෙයි.**

(vii) සෑම දෙපාර්තමේන්තු ප්‍රධානයෙක් ම අපෙක්ෂකයන්ගේ සුදුසුකම් පිළිබඳ හරිවැරදි බලා ඇතුල්වීමේ ලැයිස්තුව (පිටපත් තුනකින්) රෙජිස්තර තැපෑලෙන් විභාග කොමසාරිස් තුමාට ඉදිරිපත් කළ යුතු ය. ලෙහෙසියෙන් හඳුනා ගැනීමට හැකි වන පරිදි ලැයිස්තු බහනු ලැබූ ලියුම් කවරයෙහි වම් පස මුදුන් කොණෙහි විභාගයෙහි නම ලිවිය යුතු ය.

(viii) ඇතුල්වීමේ ලැයිස්තු පෝරම අවශ්‍ය ප්‍රමාණයක් 1959යේ අප්‍රේල් මස 27 වැනි දින සිට මැයි මස 11 වැනි දින දක්වා විභාග දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැකි ය. ප්‍රමාණවත් ගණනක් ලැයිස්තු නිකුත් කිරීමට විභාග දෙපාර්තමේන්තුවට ඉඩ සැලසෙන පරිදි විභාගයට පෙනී සිටීමට ඉදිරිපත් වෙතැයි සිතෙන අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව පිළිබඳ දැනුම් දීමක් කළ යුතු ය. වැඩි පුර ඉතිරිවන ලැයිස්තු පසුව පවත්වන විභාග සඳහා ආරක්ෂා කර ගැනීම මැනවි. සම්පූර්ණ කළ සියලු ම ඇතුල්වීමේ ලැයිස්තු 1959යේ මැයි මස 12 වැනි දින හෝ ඊට පෙර විභාග කොමසාරිස්තුමා වෙත ලැබිය යුතු ය.

(ix) ඇතුල්වීමේ ලැයිස්තු භාර ගන්නා අවසාන දිනට පසුව විභාග කොමසාරිස් තුමා වෙත ලැබෙන ලැයිස්තු ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

5. **ප්‍රවේශ පත්‍ර :**

(i) විභාග කොමසාරිස් තුමා විසින් කෙළින් ම, යොග්‍ය අන්දමින් ප්‍රාදේශික ප්‍රධාන තැන වෙත හෝ දෙපාර්තමේන්තු ප්‍රධාන තැන වෙත ඇතුල්වීමේ ලැයිස්තුවේ දෙවැනි පිටපත, (අ) එක් එක් විභාගාපෙක්ෂකයාට දෙන ලද සූචි අංක සහ (ආ) විභාග (ශාලා) ස්ථානය, සටහන් කොට ආපසු යවනු ඇත. මේ සමග ම ප්‍රවේශ පත්‍ර ප්‍රමාණවත් සංඛ්‍යාවක් ද අපෙක්ෂකයන්ගේ හැසිරීම සම්බන්ධ නීති රීති ද යවනු ලැබේ.

ප්‍රාදේශික ප්‍රධාන තැන ඇතුල්වීමේ ලැයිස්තුවේ දෙවැනි පිටපතෙහි සටහන් කොට ඇති අයුරින් එක් එක් ප්‍රවේශ පත්‍රයක නම, සූචි අංකය, මධ්‍යස්ථානය සහ විභාග (ශාලා) ස්ථානය, ලියා තම අපෙක්ෂකයන්ට නිකුත් කළ යුතුය. ඇතුල් වීමේ ලැයිස්තුවේ දෙවැනි පිටපතේ අපේක්ෂකයන්ට දී තිබෙන සූචි අංක, එම අපේක්ෂකයන්ගේ ප්‍රවේශ පත්‍රවල යෙදීමේ දී කිසිම වැරදීමක් සිදු නොවන සේ වග බලා ගැනීමට ප්‍රාදේශික ප්‍රධාන තැන ඉතා පරීක්ෂාකාරී විය යුතු ය. විභාග කොමසරිස්තුමාට නොදවන්වා, කිසිම අවස්ථාවක දී ප්‍රාදේශික ප්‍රධාන තැන සූචි අංකයක් වෙනස් නොකළ යුතු ය. ඊට පසුව ප්‍රාදේශික ප්‍රධාන තැන **ඇතුල්වීමේ ලැයිස්තුවේ දෙවැනි පිටපත රෙජිස්ටර කවරයක බහා වහා ම විභාග කොමසාරිස් තුමාට (ප්‍රතිඵල ශාඛාව) ආපසු එවිය යුතු ය. එම කවරය මුදුනෙහි විභාගයේ නම ද "ඇතුල් වීමේ ලැයිස්තුවේ දෙවැනි පිටපත" යන්න සඳහන් කළ යුතු ය.** ප්‍රධාන තැන මෙසේ කිරීම අතපසු කළ හොත්, ඔහුගේ නිලධාරීන්ගේ ප්‍රතිඵල ඔහුට දන්වනු නොලැබේ.

(ii) පරීක්ෂණයට පෙනී සිටින සෑම අපේක්ෂයෙකු ම තම ප්‍රවේශ පත්‍රය පරිපාලන නිලධාරි තැනට භාර දිය යුතු ය.

(iii) විභාග වල දී හැසිරිය යුතු ආකාරය ගැන විභාග කොමසාරිස් තුමා විසින් පනවා ඇති නීති රීති හා රෙගුලාසිවලින් සෑම අපේක්ෂකයෙක් ම බැඳී සිටියි. මේ නීති රීති හා රෙගුලාසි කඩ කිරීම ගැන එතුමා පනවන ඕනෑ ම දඩුවමකට ද ඔහු යටත් විය යුතු ය.

(iv) කිසියම් ප්‍රාදේශික ප්‍රධානයකුට අඩු ගණනේ විභාග දිනයට සත් දිනකම කලින් තම අපෙක්ෂකයන් සඳහා ප්‍රවේශ පත්‍ර නොලැබුණොත් අප්‍රමාදව ම ඔහු කොළඹ 2, විභාග කොමසාරිස් තුමාට ඒ බව දැන්විය යුතු යි. (විදුලි පණිවුඩ ලිපිනය : ඇක්සැම්ස්, කොළඹ.)

6. **විභාග පරිපාටිය :**

විභාගය පහත දක්වන කොටස් වලින් යුක්ත වෙයි :—

(1) සිංහල—සාමාන්‍ය පෙළ

(2) සිංහල—උසස් පෙළ

(3) දෙමළ—සාමාන්‍ය පෙළ

(4) දෙමළ—උසස් පෙළ

**අපේක්ෂකයකුට පෙනී සිටිය හැක්කේ මෙයින් එක් කොටසකට පමණකි.**

(ii) සාමාන්‍ය පෙළ සඳහා අපේක්ෂා කරන දැනීම කනිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දැනීම වෙයි. උසස් පෙළ සඳහා පොදු අධ්‍යාපන සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ දැනුම අපේක්ෂා කරනු ලැබේ.

(iii) මේ විභාගයෙන් සාමාර්ථ්‍යයක් ලබා ගනු සඳහා, සෑම ප්‍රශ්න පත්‍රයකින් ම එහි නියමිත ලකුණු වලින් අඩු ගණනේ සියයට 40 ක් අපේක්ෂකයන් විසින් ලබාගත යුතුය.

**නිර්දේශ පත්‍රිකාව**

**සිංහල හෝ දෙමළ භාෂා**

**සාමාන්‍ය පෙළ**

ලකුණු

(i) භාෂාව හා රචනය පැ. 3ක එක ප්‍රශ්න පත්‍රයයි——————150

මේ ප්‍රශ්න පත්‍රයට පහත දක්වන කරුණු ඇතුළත් වෙයි. එනම්:—(i) වර්ණනා, දෙබස්, ලියුම් ලිවීම කායඝිලයීය සටහන් හා වාර්තා, භාවාර්ථ ලිවීම යන රචනා වගී එකක් හෝ වැඩි ගණනක් අඩංගු අභ්‍යාස, (ii) සරල වූ ද කලින් සූදානමක් නැත්තා වූ ද වාක්‍ය ඛණ්ඩයන්ගේ අවබෝධය පිළිබඳ ප්‍රශ්න, සහ (iii) අර්ථය, ක්‍රියාකාරක පද සම්බන්ධය, වාක්‍යාංශ සහ වාක්‍ය, දොෂ ආදී සියල්ල ම සමහරක් පිළිබඳ ප්‍රශ්න.

(ii) පරිවර්තනය-පැ. 3ක එක ප්‍රශ්න පත්‍රයයි. ............ 150

(i) සරල වාක් සම්ප්‍රදා, සරල ගද්‍ය ඛණ්ඩයක වාක්‍ය හා වාක්‍යාංශ, සහ කායඝිලයීය ලේඛනයකින් හෝ ප්‍රවෘත්ති පත්‍ර වර්තාවකින් උපුටා ගත් පහසු කොටසක් ඉංග්‍රීසියට සහ සිංහළ/ දෙමළ භාෂාවලට ද (ii) කායඝිලයීය ශබ්ද හා පාඨ මාලා සිංහල/දෙමළ භෂවලට ද පරිවර්තනය කිරීම.

**සිංහළ හෝ දෙමළ භාෂා**

**උසස් පෙළ**

(i) භාෂාව හා රචනය-පැ. 3ක එක ප්‍රශ්න පත්‍රයයි ............ 150

මේ ප්‍රශ්න පත්‍රයට පහත දක්වන කරුණු ඇතුළත් වෙයි. එනම්:- වාක්‍ය රචනාවක් (තෝරා ගැනීමට මාතෘකා කීපයක් දෙනු ඇත.) ලියුම් ලිවීම, භාවාර්ථ ලිවීම, කායඝිලයීය සටහන් හා වාර්තා යන රචනා වගී එකක් හෝ වැඩි ගණනක් අඩංගු අභ්‍යාස, (ii) සාරාංශයක් (කාර්යාලයීය ලේඛනයකින් හෝ ප්‍රවෘත්ති පත්‍රයක කතීඃ වාක්‍යයකින් හෝ ලිපියකින් ගද්‍ය ඛණ්ඩක් කෙටි කර ලිවීම) සහ (iii) අර්ථය ක්‍රියා කාරක පද සම්බන්ධය. වාක්‍යාංශ සහ වාක්‍ය, දොෂ, අලංකාර, වාක්‍ය විභාගය සහ සම්බන්ධය ආදී සියල්ලම හෝ සමහරක් පිළිබඳ ප්‍රශ්න.

(ii) පරිවර්තනය-පැ. 3ක එක ප්‍රශ්න පත්‍රයයි. ............ 150

(i) වාක් සම්ප්‍රදා, ගද්‍ය හෝ පද්‍ය ඛණ්ඩයකට අයත් වාක්‍ය හා වාක්‍යාංශ, සහ කායඝිලයීය ලේඛනයකින් හෝ ප්‍රවෘත්ති පත්‍ර වාර්තාවකින් උපුටා ගත් කොටසක් ඉංග්‍රීසියට සහ සිංහළ/ දෙමළ භාෂාවලට ද (ii) කාර්යාලයීය ශබ්ද හා පාඨ මාලා සිංහළ/දෙමළ භාෂාවලට ද පරිවර්තනය කිරිම.

පොදු වශයෙන් කාර්යාලයීය ලිවීම් වලදී භාවිතා වන පාරිභාෂික ශබ්ද හා පාඨ මාලාවන් ද රජයේ කාර්ය පරිපාටිය ද සම්බන්ධ කරුණු ගැන සැළකිල්ලක් හා අවධාරණයක් දක්වෙන සේ ප්‍රශ්නපත්‍ර පිළියෙළ කරනු ඇත.

(v) අශොභන අත් අකුරු වලට ද අක්ෂර වින්‍යාසයේ වැරදිවලට ද ලකුණු කපනු ලැබේ .

7. **විභාගයේ කාල සටහන :**

9-12 දහවල් - සිංහළ/දෙමළ (සාමාන්‍ය/උසස්),
භාෂාව හා රචනය

1-4 සවස - සිංහළ/දෙමළ (සාමාන්‍ය/උසස්),
පරිවර්තනය

සෑම අපෙක්ෂකයෙකුම මේ කාල සටහන මනාව සිහියේ තබා ගත යුතු යි. ප්‍රවේශ පත්‍රයත් සමග වෙනම කාල සටහනක් නිකුත් කරනු නොලැබේ.

8. **විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු :**

දෙපාර්තමේන්තු ප්‍රධානීහු, විභාගය සඳහා තමන් විසින් අයදුම් පත් ඉදිරිපත් කරන ලදුව, තම දෙපාර්තමේන්තුවල සිටින නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට නිවාඩු දිය යුතු ය. මේ නිවාඩු, රාජකාරි නිවාඩු ලෙස සැළකිය යුතු ය.

9. **ප්‍රතිඵල :**

විභාග කොමසාරිස් තුමා ඇතුල්වීමේ ලැයිස්තුවේ දෙවැනි පිටපත සෑම දෙපාර්තමේන්තු ප්‍රධානයකු වෙතම ඔහුගේ නිලධාරීන්ගේ ප්‍රතිඵල සහිතව ආපසු එවනු ඇත. එක එක ප්‍රශ්න පත්‍රයකින් ලැබූ සමඝ අස මඝනාවය එහි ලකුණු කර තිබෙනු ඇත. සෑම දෙපාර්තමේන්තු ප්‍රධානයකු ම නොයෙක් ප්‍රාදේශීය කාර්යාල හෝ උප කාර්යාල හෝ පාඨශාලා වල නියුක්ත තම නිලධාරීන්ට ප්‍රතිඵල දන්වා යැවිය යුතුය.

මේ සමගම දෙපාර්තමේන්තුවේ පෞද්ගලික ලිපිගොනුවල, තැන්පත් කිරීම සඳහා, සම්බන්ධ වූ අපේක්ෂකයන්ගේ අත්සන් පෝරම එවනු ලැබේ. එමෙන් ම ඔවුන්ගේ චරියා සටහන්වල ද අවශ්‍ය කරුණු සටහන් කරනු ලැබේ.

පළාත් ආණ්ඩු සේවයේ නියුක්ත නිලධාරීන් සම්බන්ධයෙන් සමර්ථ වූ අයගේ අත්සන් පෝරම සහ ඇතුල් වීමේ ලැයිස්තුවල දෙවැනි පිටපත විභාග කොමසාරිස් තුමා විසින් පළාත් ආණ්ඩු සේවා කොමිෂන් සභාවේ සභාපති තුමා වෙත යවනු ලැබේ.

චරියා සටහන් භාණ්ඩාගාරයේ තබා ගන්නා වූ, ගණකාධිකාරී සේවය, සාමාන්‍ය ලිපිකරු සේවය, ලඝු ලේඛකයන්ගේ මාරු කළ හැකි සේවය, සරප් සේවය, ටයිප්කාර සේවය, රජයේ දිස්ත්‍රික් ලිපිකරු සේවය, අර්ධ ලිපිකාර සේවය සහ පරිවර්තක සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන්, විභාග කොමසාරිස් තුමාගෙන් ප්‍රතිඵල ලැබුණු පසු සුදුසු සටහන් භාණ්ඩාගාරය විසින් ම තබනු ලැබේ.

10. විභාග කොමසාරිස් තුමාට විභාග අයදුම් පතක් ප්‍රතික්ෂෙප කිරීමට ද, අපේක්ෂකයකුට විභාගයට ඉදිරිපත් වීම නවතාලීමට ද, කිසියම් ප්‍රතිඵලයක් නතර කර ගැනීමට ද, නැත හොත් කිසියම් ප්‍රතිඵලයක් අවලංගු කර දැමීමට ද ඕනෑම ප්‍රමාණවත් හේතුවක් නිසා පුළුවන. පසුව සපිර කිරීමට හෝ අවලංගු කිරීමට හැකිවන පරිදි කිසියම් අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමේ තාවකාලික අවසරයක් දීමට ද පුළුවන් කම තිබේ.

11. (අ) ස්ථිර තනතුරු දරන නිලධාරීන් සම්බන්ධයෙන් ස්ථිර නිලතල පඩිකති, ශ්‍රේණි හෝ සේවයෙන් උසස් කරගැනීම සඳහා ඔවුන් කරන ඉල්ලීම් සළකා බැලීමේ දී, **මේ විභාගයෙන් ලැබූ සාමර්ථ්‍යයක් (පෙළ දෙකෙන් ඕනෑම පෙළකින්) ඇත්නම් එය වැදගත් දෙයක් සේ ගණන් ගන්නවා ඇත.**

(ආ) තාවකාලික තනතුරු දරන නිලධාරීන් සම්බන්ධයෙන්, මේ විභාගයෙන් සමර්ථවීම තනතුරු ස්ථිර වීමේ හිමිකමකට කරුණක් ලෙස සළකනු නොලැබේ. එමෙන් ම සිංහල භාෂාවෙන් උසස් පෙළේ විභාගයෙන් සමර්ථවීම නිසා, 1957 මැයි මස 23 වැනි දතමින් යුත් අංක 379 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ දැක්වෙන ප්‍රසාද දීමනාවට ද හිමිකමක් ඇති නොවේ.

12. මේ රෙගුලාසිවල විධිවිධාන යොදා නැති ඕනෑම කරුණක් සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ ලේකම් තැනගේ අභිමතය පරිදි ක්‍රියා කරනු ඇත.

සී. ජී. එල්. මිසෝ,
භාණ්ඩාගාරයේ වැඩබලන නියෝජ්‍ය ලේකම්,
භාණ්ඩාගාරයේ ලේකම් වෙනුවට.

1959, අප්‍රේල් මස 21 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ජාත්‍යන්තර සහයෝගතා සංවිධානය (ICA)

අධ්‍යාපන අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් 1959 ජූලි 3 වැනි දින පෙරවරු 10.30 දක්වා, අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| ද්‍රව්‍ය | | ටැන්ඩර් අංකය |
|---|---|---|
| (1) ප්‍රක්ෂේපක (Projectors) | ... | ICA-236 |
| (2) දෙර හතරේ ස්ටේෂන් වැගන් වර්ගයේ රථ | ... | ICA-237 |
| (3) විදුලි ජනක (Generators) | ... | ICA-238 |

කොළඹ පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ටැන්ඩර් පෝරම ලබාගත හැක. ටැන්ඩර් පෝරම ලබා ගැනීමට පෙර ටැන්ඩර් කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන් ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඇල්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1959 අප්‍රේල් 21 වෙනි දින,
කොළඹ 1.

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ජාත්‍යන්තර සහයෝගතා සංවිධානය (ICA)

1959 පෙබරවාරි 27 වැනි දින අංක 11,680 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් රජයේ වැඩ දෙපාර්තමේන්තුවට ඩම් ට්‍රක් රථ (ටැන්ඩර් අංක ICA-216) සැපයීම සඳහා වූ ටැන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1959 මැයි 26 වැනි දින තෙක් කල් දමන ලද බව කරුණාවෙන් සලකන්න.

ඇල්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1959 අප්‍රේල් 21 වෙනි දින,
කොළඹ 1.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### මුරුන්කන් ගොවිපොළට පිළිස්සූ ගඩොල්, වැලි ආදිය සැපයීම

වව්නියා කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි තැන විසින් පහත සඳහන් දේවල් සඳහා ටෙන්ඩර් පත්‍ර 1959 මැයි මස 8 වැනි දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ :—

| | | | |
|---|---|---|---|
| පිළිස්සූ ගඩොල් | ... | ... | 13,000 |
| ගඟේ වැලි කියුබ් | ... | ... | 5 |
| අඟල් 1 කළු ගල් කියුබ් | ... | ... | 3 |
| ග්‍රැවල් කියුබ් ... | ... | ... | 13 |

වව්නියා ගොවිපොළට සැපයීම හා ගෙනැවිත් භාරදීම.

2. වව්නියාවේ, කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර (පිටපත් දෙකකින්) ලියුම් කවරයක දමා සීල් තබා පරිපාලන නිලධාරි තැන, කෘෂිකර්ම කාර්යාලය, වව්නියාව, යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කෙළවරෙහි "මුරුන්කන් ගොවිපොළට ගඩොල් ආදිය සැපයීමේ ටෙන්ඩර්" යන්න ලියා එවිය යුතුයි. එක එක කාර්යයට වෙන වෙනම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 10 තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10 ක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්ට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් නොඑවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් වව්නියාවේ කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "මුරුන්කන් ගොවිපොළට ගඩොල් ආදිය සැපයීමේ ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර් කරුගේ නාම සහ ලිපිනයද සඳහන් කළ යුතුය. රෙජිස්ටර් තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු වව්නියාවේ කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලක නිලධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර් කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී වව්නියාවේ කෘෂිකර්ම කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

මාගීයෙන් ලබා ගත යුතුයි. ලාංකික නොවූ කම්කරුවන් හෝ එම ප්‍රදේශයෙන් බැහැර කම්කරුවන් මේ වැඩ කටයුතු සඳහා යෙදවීම කොන්ත්‍රාත්තුව පැහැර හැරියා වෙනවා ඇත. තවද, කොන්ත්‍රාත් කරුවා විසින් කෘෂිකම් අධ්‍යක්ෂක තුමා විසින් බලය දෙන ලද නිලධාරියෙකුට ඔහුගේ පොත්, චැක්රෝල් යනාදිය බැලීමට ඉඩ දිය යුතුයි.

16. කොන්ත්‍රාත්කරුවාට භාර දිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහුගේ ලිපිනයට තැපෑලෙන් යැවුවහොත් එසේ නැතහොත් ඔහු ලියා දී තිබෙන ස්ථානයට ගෙන ගොස් දුන්නහොත් ඔහුට භාර දුන්නා කොට සැලකිය යුතුයි.

17. කෘෂිකම් අධ්‍යක්ෂ තැන විසින් සේවයට නුසුදුසු යයි නිගමනය කරන ලද කම්කරුවන් කොන්ත්‍රාත්කරුවා විසින් සේවයට නොගත යුතුයි.

18. තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු විසින් ඇපකරුවන් දෙදෙනෙකු සොයා ගෙන ඔහුගේ වියදමින්ම පොරොන්දු පත්‍රයට අත්සන් තැබිය යුතුයි. එම ඇපකරුවන් කෘෂිකම් අධ්‍යක්ෂ තැන විසින් අනුමත කළ යුතුයි.

19. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනකුගේ නමක් සමඟ නම ඇතුළු වූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකම් අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

20. අසතුටුදායක වැඩ හා කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ඉටු නොකිරීමත් නිසා කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකම් අධ්‍යක්ෂ තැන වෙත තබා ගනු ලැබේ.

21. මේ පිළිබඳ වැඩි විස්තර පේරාදෙනියේ කෘෂිකම් දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වැඩපොලේ පරිපාලන නිලධාරි තැනගෙන් ලබා ගත යුතුයි.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්ෂ තැන.

1959 අප්‍රේල් මස 17 වැනි දින,
පේරාදෙනියේ දීය.

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### වාතාශ්‍රය ඇති වී ගබඩා සෑදීම

කොළඹ යූනියන් පෙදෙසේ, කෘෂිකම් හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1959 ජූනි 6 වැනි දින පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් ස්ථානවල වාතාශ්‍රය ඇති වී ගබඩා සෑදීම සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

(1) කුරුණෑගල දිස්ත්‍රික්කයේ බතලගොඩ වී මධ්‍යස්ථානය.
(2) අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහ ඉලුක්පල්ලම පාසැල් ගොවිපල.
(3) නුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාලේ ගොවිපල.
(4) යාපනේ දිස්ත්‍රික්කයේ පරන්තන් ගොවිපල.
(5) මඩකලපුවේ.

2. පෝර්ම කොළ පේරාදෙණියේ කෘෂිකම් දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වැඩපොලේ පරිපාලක නිලධාරි තැනගෙන් ලබාගෙන ඒවායෙහි ටෙන්ඩර් පත්‍ර ලියා එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් ද සහිතව ලියුම් කවරයක දමා සීල් තබා ඒ කවර යෙහි "සභාපති මහතා, ටෙන්ඩර් පත්‍ර මණ්ඩලය, කෘෂිකම් හා ආහාර අමාත්‍යාංශය, යූනියන් පෙදෙස, කොළඹ යන්න ලියා එහි මුදුනේ වම් කෙළවරේ (ස්ථානය) ........................ හි වාතාශ්‍රය ඇති වී ගබඩා සෑදීම සඳහා ටෙන්ඩරය" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර කෘෂිකම් හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. එසේ නැත්නම් ඒවා රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිත යන් විසින් හෝ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට බලය දී තිබෙන නිල ධාරි තැන වූ කෘෂිකම් හා ආහාර අමාත්‍යාංශයේ සහකාර ලේකම් මහතාට භාරදිය යුතුයි. එම ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයෙහි "(ස්ථානය) ........................ හි වාතාශ්‍රය ඇති වී ගබඩාවක් සෑදීම සඳහා ටෙන්ඩරය" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද සඳහන් කළ යුතුයි.

